# ඇලීෂියා



ශේන්‍යා මිහේලි විජේසිංහ

# ඇලීෂියා

ශේන්යා මිහේලි විජේසිංහ
කතෘ

කතෘගේ වෙනත් කෘති

බබල්

මහාමායා බාලිකා විද්‍යාලය,
මහනුවර.
6-G ශ්‍රේණිය
20.05.2026

ISBN - 978-624-211-395-1

# පිදුම

මා ආදරණීය මවට , පියාට,

අත්තම්මාට සහ

දයාබර සොයුරන්ට

ගෞරවයෙන් යුතුව පිළිගන්වමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# පටුන


| | පිටු අංක |
|---|---|
| 1. හෙලෝ! | 1 |
| 2. වැස්සක් | 2 |
| 3. අමුතු දේවල් | 3 |
| 4. පන්තියට ආ රස්නය | 4 - 6 |
| 5. අත්තම්මා | 7 - 8 |
| 6. පුදුම දේවල් | 9 - 10 |
| 7. අලුත් තොරතුරු | 11 - 14 |
| 8. අපිට පුළුවන්! | 15 - 16 |

# 1.හෙලෝ

මගේ නම ඇලීෂියා. මට වයස අවුරුදු දොළහයි. මාත් එක්ක ඉන්නේ අම්මාත්, තාත්තාත් විතරයි. තවත් දෙයක්! මට සමහර වෙලාවට හිතෙනවා මම හරිම අමුතු ළමයෙක් කියලා, "හෝච් හෝච් කෙල්ලේ" මගේ හිත කතා කළා."ඔය ඇති දැනට. දැන්ම ඉතින් මිනිස්සු වහ වට්ටගන්න එපා!"

මගේ හිත මොනවා කිවුවත් මොකෝ? කමක් නෑ..

ඉතින්, අපි පටන් ගමු !



# 2. වැස්සක්

“ඒ ඇලී, මොකක්ද ඔතනට වෙලා කරන්නේ? එන්නකෝ සෙල්ලමක්වත් කරන්න" මට වින්ඩිගේ හඬ ඇසුණා.
"ආ හා, මේ හරි හරි" මං උඩ විසිවුණා. ඇත්තටම කිව්වොත් මං මේ ඉන්නේ ඉස්කෝලේ.
විනී කියන්නේ මගේ හොඳම යාළුවා. එයාගේ ඇත්ත නම වින්ඩි. අපි තුන වසරේ ඉඳන් හොඳ ම යාළුවෝ.
කොහොම වුණත්, අපි සෙල්ලම් කරද්දි අම්මා ආවා. අද අපේ ගෙදර ඇවිත් ටිකක් ඉඳලා තමයි යන්නේ. අම්මා ඇවිත් තිබුණේ පයින්, ව්‍යායාම්වලට කියලා. ඉතින් අපි යන්න පිටත් වුණා.
අපි ටික දුරක් යද්දි අහසේ කළු පාට වලාකුළු රොක් වෙන්න පටන් ගත්තා. වැඩි වෙලාවක් යන්න කලින් වහින්න පටන් ගන්න බව මට තේරුණා.මම යාඥා කරන්න පටන් ගත්තා. මම වැස්සට කැමතිම නැහැ. අඩු ම ගානේ අපි තුන්දෙනා ගාව කුඩයක්වත් තිබුණේ නැහැ.
"අනේ කරුණාකරලා වහින්න එපා. කරුණාකරලා.."
මං ඒක කියලා විනාඩියක්වත් ගියේ නැහැ. හිතාගන්න බැරි වේගයකින් කළු වලාකුළු ඔක්කොම ඈතට පාවෙලා ගියා.
වින්ඩි මං දිහාව නිකන් අමුතුවට වගේ බලන් හිටියා. මමත් ඇත්තට ම ගොඩක් පුදුම වෙලා හිටියත් මම මුකුත් නොදන්න පොඩි එකා වගේ රඟපෑවා.
කොහොම හරි, අපි කරදරයක් නැතුව ගෙදර ආවා. ඒත් වින්ඩි දාපු බැල්ම නම් වෙනස් වුණේ නැහැ.

# 3. අමුතු දේවල්

අපි දෙන්නව කාමරේ තියලා අම්මා අපිට බොන්න දෙයක් හදන්න ගියහම මම වින්ඩිගෙන් ප්‍රශ්නයක් ඇහුවා.
"ඇයි ඔයා අර වෙලාවේ මාව කන්න වගේ බලන් හිටියේ?"
වින්ඩි උත්තර දුන්නා. "ඇලීෂියා , වැස්ස එද්දිම ඔයා මතුරපු වචන මට ඇහුණා. ඒත් එක්කම වැහි වලාකුළුත් නැතිවෙලා ගියා. මට තේරුම් ගන්න බැරි ඒකයි ඇලී"
එයා හැඟීම්බරව කිව්වා.
මටත් ඒ වුණු වැඩේ තේරුම්ගන්න බැරිවුණත් මම මහදැනමුත්තා වගේ මෙහෙම කිව්වා.
"ඕක අහන්නත් දෙයක්ද වින්ඩි? ඔය වගේ අමුතු සිදුවීම් කොච්චර වෙනවා ද? ඒ වෙලාවේ හුළඟකුත් තිබ්බනේ.""ඒ වෙලාවේ හුළඟක් නම් තිබුණේ නැහැ." මගේ හිත කිව්වා.
"කට වහගන්න" මම හිතට සැර කළා.
කොහොම වුණත් වින්ඩිගේ මූණට සැනසිලිදායක පෙනුමක් ආවා.
"ඔයා කියනවා හරි ඇලී" එයා කිව්වා.
"ඉතින්... දැන් අපි ටිකක් විනෝද වෙමු!"
අපි එදා හවස් වෙනතුරුම හොඳට විනෝද වුණා. සෙල්ලම් කලා. කොහොම හරි, සතියක් දෙකක් යනකොට අපිට මේ සිද්ධිය සම්පූර්ණයෙන්ම අමතක වෙලා ගියා.

# 4. පන්තියට ආ රස්නය

ඒ වෙලාවේ අපිට තිබුණේ ගොඩක් අමාරු ගණිතය විභාගයක්. මම හිතුවේ නෑ ඒක මේ තරම් අමාරු වෙයි කියලා. සරලවම කිව්වොත් මම පාඩම් කරලාවත් තිබුණේ නෑ හරියකට.
අපේ ටීචර්, මිස් ජෙසිකාත් අපි දිහා ඇස් අහකට ගන්නෙම නැතිව ගිලින්න වගේ බලා හිටියා.
වින්ඩිත් මාත් අතර අපිට ආවේණික භාෂාවක් තියෙනවා, ඒකෙදි අපි කතා කරන්නේ මූණේ ඉරියව් වලින්. මට නම් හිතෙන්නේ හැම හොඳම යාළුවෝ දෙන්නෙක් අතරම එහෙම භාෂාවක් ඇති. එහෙම නේද?හරි, ඉතින් මට ඕන වුණා වින්ඩි දිහා බලලා එයාගෙන් "අමාරුද?" කියලා අහන්න. ඔන්න හැබැයි කොපි කිරීම වගේ දෙයක් නෙවෙයි හරිද. හැබැයි මං වින්ඩි දිහා බැලුවොත් මිස් ජෙසිකා අනිවායර්යෙන් ම හිතාවි මම වින්ඩිගෙන් කොපි කරනවා කියලා.
වැඩේ කියන්නේ මිස් ජෙසිකා බලා සිටින එකේ නැවතීමකුත් නෑ. ඉතින් ඒ වගේ අහිංසක දේකට ඉඩකුත් නෑ. මං කියන්නේ... වෙන කෙනෙක් කන්න වගේ බලන් ඉන්නකොට අමාරුයිනේ?
මට මිස් ජෙසිකා ගැන ඇතිවුණේ පොඩි තරහක්. මං හිත ඇතුළෙන් එයාට දොස් කිව්වා.
"ඔයා නම් හරිම කරදරයක් මිස් ජෙසිකා. ඇයි ඔයාට බැරි ඔයාගෙ වැඩක් දිහා බලාගන්න, අපි නැතුව?"
ඉතින් මං ඔහොම සුටු පුටු ගගා ඉන්නකොට ජෙසිකා ටීචර් ඒක දැක්කා.
"ඇලීෂියා, මොනවද ඔය කියවන්නේ?" එයා මට රවන ගමන් ඇහුවා.
"මුකුත් නෑ මිස් මම මේ ගාණ හදනවා." මම බොහොම අහිංසක විදියට උත්තර දුන්නා.

හරි, කොහොම වුණත් මට එයාට තිබුණු අකමැත්ත වැඩි වුණා.
"අයියෝ ටීචර්, රස්නයක් වත් දැනිලා එළියට යන්නකෝ කරුණාකරලා"
මං ප්‍රාථර්නා කළා.මං ඒක හිතලා නෙවෙයි කිව්වේ.
ඒත්....
ඉර කලින්ට වඩා බැබලෙන්නට වුණා. ජනෙල් හරහා ඉර එළිය පෙරී වැටුණා. ඉවසිය නොහැකි රස්නයකින් පන්ති කාමරය පිරී ගියා.
මම වුණේ මොකක්ද කියලා තේරුම් ගන්න කලින් ටීචර් මෙහෙම කිව්වා.
"අයියෝ ළමයි මට හරිම රස්නෙයි. මම එළියට යනවා. හැබැයි කවුරුවත් හොර වැඩ කරනවා එහෙම නෙවෙයි!"
එයා අපිට රවාගෙනම එළියට ගියා.
ළමයි මිනිත්තුවක්වත් නාස්ති නොකර කසු කුසුව පටන් ගත්තා.
"ටීචර් ගිය එක කොච්චර හොඳද නේද ඇලී?" මට එහාපැත්තේ හිටි වින්ඩි කිව්වා.
"ඔව්, ඇත්ත තමා" මම යන්තම් කියාගත්තා. හැබැයි ඇත්තටම මම හිටියේ පුදුම විදියට අපහසුවෙන්.
"අනේ වින්ඩි.. ටීචටර් රස්නයක් දැනෙන්න කියලා කිව්වේ මම...."
වින්ඩි අපහසුවෙන් කෙළ ගිල්ලා. එයාගේ මූණට අමුතු පෙනුමක් ආවා.මගේ බඩ ඇතුළේ අයිස් මිදෙන්න පටන් ගත්තා.
"ඒක ගැන හිතන්නෙපා දැන්. හැබැයි ඇලී..."
ඒත් එතකොටම ජෙසිකා ටීචර් පන්තියට ඇතුළු වුණා.
"හා.... මොකක්ද මේ සද්දේ? මම ගිය ගමන් පටන් ගත්තා නේද? අනේ අනේ මේ කෙල්ලෝ කරන වැඩ" එයා අපිට කෝපයෙන් බැන වැදුණා.

★ ★ ★ ★

අපි දෙන්නා ඉස්කෝලෙ ඉවරවෙලා එළියට ගියා.
"ඇලීෂියා," වින්ඩි කතාව පටන් ගත්තා. "ඔයා කරන... ඔයාට වෙන දේවල්... අනේ මන්දා..... කොහොම වුණත් ඔයා පරිස්සම් වෙන්න."
මම තක්බීර් වෙලා බලාගෙන ඉද්දි මගේ උරහිසට අතක් තැබූ එයා, පිටවී ගියා.



# 5. අත්තම්මා

මේ දවස් ටිකේ වෙච්ච අමුතු සිදුවීම් මට වෙන කාට හරි කියන්න ඕන වුණා. මගේ මනස තිබුණේ හොඳටම අවුල් වෙලා.

වින්ඩි නම් ඉතින් මේවා ඔක්කොම දන්නවා නේ.

එතකොට මට මතක්වුණේ මගේ අත්තම්මව. ඔයාලා දන්නවා ද, එයා හරිම කරුණාවන්ත, ලස්සන කෙනෙක්. මට මේවා අම්මටයි තාත්තටයි කියන්න හිතුණේ නැත්තේ එයාලා අනවශ්‍ය විදියට කලබල වෙයි කියලා හිතලා.

එහේ යන්න හේතුවකුත් එපැයි.

මිනිත්තු දෙකකට පස්සෙ මං හිටියේ අම්මගේ උකුල උඩ. අම්මව පොඩ්ඩක් පාච්චල් කරගන්නත් ඕන නේ.

"අම්මා, අත්තම්මා කිව්ව මට අර පලවෙනියා වුණු විභාගෙට දෙන්න තෑග්ගක් එයා ගාව තියෙනවා කියලා. අනේ අම්මා අපි එහේ යමුද?" මම අම්මගේ මුහුණ සිපගනිමින් ඇහුවා.

"මිහ්.. මට අදනම් බැරිවෙයි පැටියෝ. අපි අනිද්දා යමු. හරිද?"

"අනේ හා, හොඳ අම්මා" මම බෙරිහන් දුන්නා.

ඊටපස්සේ මම තාත්තා ගාවට දිව්වා.

"තාත්තා, අම්මා කිව්වා අනිද්දා අත්තම්මගේ ගෙදර යනවා කියලා. කමන්නෑනේ? තාත්තාටත් එන්න පුළුවන්ද?" මම කියාගෙන ගියා.

"මටනම් එන්න බැරිවෙයි දුව. ඔයා අම්මා එක්ක යන්නකෝ" එයා කිව්වා. තාත්තගේ බෙල්ල බදාගෙන ඉඹපු මම කාමරයට ගියා. මගේ දිනපොත ලියන්න.

මට වෙන හැමදේ ම මම ලියන්නේ මගේ ඩයරියේ. වැස්සෙ කතාව වගේ ම පන්තියේ වුණු සිද්ධියත් මම ලිව්වේ ඒකේ.





# 6. පුදුම දේවල්

ඊළඟ දවසේ උදේ අම්මාගෙන් පොඩි දැනුම්දීමක් ලැබුණා.
"ඇලීෂියා"
"ඇයි අම්මා?"
"දුව මට ඔයා එක්ක එන්න බැරිවෙයි. හෙට මට හදිසියේ වැඩක් වැටිලා. ඔයා තනියම යන්න දුව. කමක් නැනෙ?"
"ආ, ප්‍රශ්නයක් නෑ අම්මා. මම ටැක්සි එකක යන්නම්" මා කිව්වා. එයා වෛද්‍යවරියක්නේ. සාමාන්‍යයෙන් ඔය වගේ දේවල් වෙනවා එයාට.
"ම්, හොඳ බබා" කියූ අම්මා කුස්සියට ගියා.
මම පොඩ්ඩක් අවුලෙන් හිටියත් පස්සෙ තමා මට තේරුණේ අම්මා එන්නැති එකේ වටිනාකම. එතකොට අම්මා දැනගන්නැතිව මට අත්තම්මා එක්ක නිදහසේ කතා කරන්න පුළුවන්නේ.

★ ★ ★ ★ ★

එදා, අත්තම්මගෙ ගෙදර ගියා මං. ඇත්තට ම.... හොඳයි, මම ඔක්කොම - හැමදේම දැන ගත්තා. මගෙ ජීවිතේ අලුත් පිටුවක් පෙරළුණා වගෙයි මට දැනෙන්නේ.
මං එයාට වුණු හැමදෙයක් ම කිව්වා. මම කොයි තරම් කලබලයෙන් හිටියද කිව්වොත් මට , මං ඒක කියපු විදියවත් මතක නෑ.
මගෙ හදවත ගැහුණා. එයා මම දිහා ප්‍රශ්නාර්ථයක් දල්වං බලා හිටියා. එතකොට තමයි එයාට තේරුණේ මම මේ කියන්නේ, අහන්නේ ඇත්තට ම බව.
මොහොතක් මා දිහා බලා හිටි එයා බරට කල්පනා කරමින් වගේ එහාට මෙහාට ඇවිදින්න පටන් ගත්තා. මම නම් ඇත්තටම හිටියේ බයවෙලා."හොඳයි, මගේ දුවේ" එයා කතාව පටන් ගත්තා.



# 7. අලුත් තොරතුරු

"ඇලීෂියා, ඔයා මේක දැනගත්තෙ කොහොමද කියලා මම දන්නෙ නෑ.. කොහොම වුණත්... එන්න මගේ කාමරයට. මට ඔයාට පෙන්නන්න දෙයක් තියෙනවා දුව"
අත්තම්මා මගෙ අතින් අල්ලන් කාමරයට එක්කගෙන ගියා.
ඇත්තට ම මං එයාගෙ කාමරයට ඒතරම් ගිහින් නෑ. ඒක අමුතු ලස්සන දේවල් පිරුණු ලොකු කාමරයක්.
මාත් එක්ක ඇඳේ වාඩිවුණා එයා පුංචි කැබිනට් එකකින් දූවිලි පිරුණු, ලොකු, පරණ පොතක් අතට අරගෙන, මා දිහා ආදරණීය විදියට බලා හිටියා. සරලවම කිව්වොත් මම හිටියෙ ලොකු පුදුමයකින් කියලා කියන්න ඕන නෑනේ!
"ඇලීෂියා, ඔයාට අවුරුදු 12 යි. මම හිතුවේ නෑ එයාලා මෙච්චර බාල වයසක දී ඔයාට ඔයාගේ මැජික් බලයන් - ඔයාගේ පවසර් ලබා දෙයි කියලා"
"කවුද 'එයාලා'? මැජික් බල? මට?" දන්නෙ නැතුවට මට කෑගැහුණා." හෝ , හෝ , සන්සුන් වෙන්න පුතේ . මම ඔයාට මේ ඔක්කොම කියලා දෙන්නම් "
අත්තම්මා කිව්වා.
" දුවේ ... අපේ මුතුන්මිත්තෝ - ඔවුන් අපේ ලෝකය බේරා ගන්න , හතුරු බලවේගවලින් . ඒ මුතුන්මිත්තෝ - අපේ පරම්පරාවේ වීරයන් ඔයාට අහවලා තියෙනවා ඔයාගේ මැජික් බල . තේරුණා ද ? "
" මට - මැජික් බල? එතකොට ඔයා?? "
අත්තම්මා ලස්සනට හිනාවුණා . ඇයගේ දෑස් දිලිසුණා.
" ඔව් , දරුවෝ . මමත් මෙහෙම හිටියට , මටත් ඒවා තියෙනවා. මමත් වීරවරියක් වෙලා හිටියා "

“ ඇත්තට ම ? ඔයා මට කවදාවත් කියලා නෑනේ ! එතකොට අම්මා? ”

“ ම්හ්.. අම්මා.. මං හිතන්නේ අපේ මුතුන් මිත්තෝ අම්මාට බල දෙන්න හිතන්නැතුව ඇති . එයත් , එයාගේ වෛද්‍යවරියක් වෙලා මිනිසුන්ට උදව් කරන හීනෙත් එක්ක බැඳිලා හිටියා . එයා කරන්නෙත් ලෝකයට උදව් කිරීමක් ම තමයි. ”

“ ඇලීෂියා , මේ බලන්න ”

අත්තම්මා පොත පෙරළුවා.“ මේ ඔයා ඉපදෙන්නත් ඉස්සර අපි කරපු වික්‍රම!



"මේ ඔයාගේ එහා පැත්තේ ඉන්නේ කවුද අත්තම්මා? "
ඒ පින්තූරයේ හිටපු අනික් ගැහැනු කෙනාව පෙන්නපු මම ඇහුවා.
" ආ! මම හිතුවේ ඔයා අඳුන ගනීවි කියලා . ඒ ඔයාගේ හොඳම යාළුවා වින්ඩිගේ ආච්චි අම්මා!! "
මං දඩි බිඩි ගාලා නැගිට ගත්තා. ඇත්තටම කිව්වොත් නැගිට්ටුණා.
" වින්ඩිගේ ආච්චි ? එතකොට එයාත් මම වගේ කෙනෙක්ද? "
මම ලොකු පුදුමයකින් ඇහුවා . මෙච්චර කල් වුණු දේවල් මට තේරුම් යන්න පටන් ගත්තා.
" ඔව් , වින්ඩිත් ඔයා වගේ ම තමා . එයාගේ අත්තම්මයි මමයි හොඳම යාළුවෝ . ඔයාලත් එහෙම වුණු එක ආශිවර්ාදයක් "
එහෙම කියපු අත්තම්මා මගේ ඔළුව අතගෑවා." හොඳයි . දැන් ඔයත් වින්ඩිත් තමයි මේ ලෝකය , අපේ ලෝකය නපුරු බලවේගවලින් බේරා ගන්න වීරයෝ දෙදෙනා . ඔයාලා දෙන්නටම මැජික් බල තියෙනවා. ඔව් - ඔයාලා තමයි සුදුසුම , හොඳම ඒ වැඩේට . "
මොකක් කිව්වා ? මම , වීරයෙක්, ලෝකයට ආරක්ෂකයෙක් වෙන්න ? ස්තූතියි , ඕන නෑ !
මං හිත ඇතුළෙන් කිව්වා.
මගේ නිහඬතාවය දැකපු අත්තම්මා , මගේ අත අල්ලාගෙන " ඔයා අධෛයර්මත් වෙන්නවත් , බය වෙන්නවත් එපා . මං දන්නවා , ඔයාට පුළුවන් දූවේ .. කොහොම වුණත් , දැන් ගෙදර යන්න . ඔයා ගොඩක් කලබල වෙලා ඉන්නෙ " කියලා කිව්වා .
ඊළඟට එයා මාව බදාගෙන හාදුවක් මූණට දුන්නා. මම අත්තම්මාගෙ ගෙදරින් එළියට ආවා.

# 8. අපිට පුළුවන්!

මම ගෙදර ගිහින් කල්පනා කළා . අත්තම්මා කියන විදියට වින්ඩිත් මමත් වීරවරියෝ - ලෝකයේ ආරක්ෂකයෝ .

මම ෆෝන් එක අරගෙන වින්ඩීට අපේ ගෙදරට එන්න කියලා කතාකළා. මට මේ දේවල් එයා එක්ක කතා කරගන්න ඕන බව දැනුණා.

පොඩි වෙලාවකට පස්සේ දොරට තට්ටු කරන හඬක් ඇහුණා. වින්ඩී දොර ගාව හිටගෙන.

ඔව් ඉතින් , මම එයා එක්ක කතාකළා . හැමදෙයක්ම කිව්වා.

අන්තිමට මං එයාගෙන් “ වින්ඩි , ඔයා මේ ඔක්කොම දැනගෙන හිටියා නේද? ” කියලා ඇහුවා.

වින්ඩි පුංචි හිනාවක් ඇතුව මගේ මූණ දිහා බැලුවා.“ ඔව්. මම නොකිව්වට , ඔයා නොහිටි තැන්වල මටත් අමුතු අමුතු දේවල් සිද්ධ වුණා. මම ඔයාට මොනවත් කිව්වෙ නැත්තෙ ඔයා කලබල වෙයි කියලා හිතුනු නිසා.

මගේ අත්තම්මාත් මට මේ ගැන කිව්වෙ අද උදේ තමා ඇලීෂියා. අපි , අපි ගැන දැන ගත්තේ එකම වෙලාවට , එක ම විදියට ! ”

පුදුම හිතෙන දේවල් එක පිට එක.

“ දැන් ... ඉතින් අපි දෙන්නා තමයි මේ ලෝකේ ආරක්ෂකයෝ නේද ? ”

මම වින්ඩිගේ අත් දෙක අල්ලා ගන්නා . එයා මගේ ඇස් දෙක දිහා බැලුවා.

ඔව්! අපිට පුළුවන්!



# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN - 978-624-211-395-1